
සිඟිත්ගේ බෝනික්කා
විදුනි තිලින්දි සෙනෙවිරත්න

# සිඟිත්තිගේ බෝනික්කා

විදූනි තිලින්දි සෙනෙවිරත්න

# “සිහිතිගේ බෝනික්කා”

කර්තෘ ප්‍රකාශනයකි

ප්‍රථම මුද්‍රණය 2023 දෙසැම්බර්

## කතාව හා චිත්‍රය

විදුනි තිලින්දි සෙනෙවිරත්න

4 ශ්‍රේණිය A

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

ISBN: 978-624-208-070-3

# <u>පිදුම</u>

පන්හිඳ අතට ගෙන

පත් ඉරුව මත අකුරු කරන්නට

මාහට ශිල්ප ලබන්නට

නොවිදනා දුක් විද

මට ශක්තිය දෙන

සෙනෙහෙබර මාගේ

අප්පච්චිට, අම්මාට

දයාබර

විදුහල්පතිනියට

පන්තිභාර ගුරුමෑණියන්ට

හදවතින් පුදමි මම

සිඟිතිගේ බෝනික්කා........

<u>පෙරවදන</u>

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන් ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවයන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේනම් පාසල වගකිම පවරන දරුවාගේ විභවතා හදුනාගෙන ඒවා ඔපවත් කිරිම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්විම අපගේ වගකිමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මඟපෙන්විම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරිමේ ප්‍රථිපලයක් ලෙස දේශිය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරිමට ලැබිම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලින ජාතික අවශ්‍යතාවයක් සපුරාලිමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගි ඇති පොත් ලිවිමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදි. දරුවන්ට අත්දැකිම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු විම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර, විද්‍යුත් පොත් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්විම අගයකරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුලින් ලැබුණු අත්දැකිම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන් ආදි ශිෂ්‍යයාවන් සෙසු පාසල්වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023.11.01

“කොහොමද පොඩි බෝනික්කෝ, ඔයා කැමතිද මාත් එක්ක අපේ ගෙදර යන්න? ” පුංචි සිහිති ඇහුවා. පුංචි සිහිති බෝනික්කාට දාන නම මොකක්ද කියලා සිතන්න පටන් ගත්තා. එයා අම්මා ලගට දුවලා ගිහින් “අම්මේ මට බෝනික්කාට දාන්න හොද නමක් කියන්නකෝ ” කියා කිවුවා .

“අපි එයාට ලස්සන නමක් දාමු , ‘හියෝනා’ කියන



නම හොදයි නේද? අම්මා කිව්වා. “ අම්මේ ඒ නම නම් හොදයි ඒත් මට පොඩ්ඩක් කියන්න අමාරුයි” පුංචි සිහිනි කිව්වා. “අම්මේ අපි වින්ඩි කියන නම දාමු , ඒ නම හොදයි නේද අම්මේ ? ” පුංචි සිහිනි ඇහුවා.




සිඟිතිට හිටියා ලස්සනම ලස්සන පූස් පැටියෙක්. එයා හරිම දඟයි එක දවසක් අම්මා එක්ක පොළට ගිහින් එන විට සිඟිති දැක්කා පූස් පැටියා වින්ඩිව අරන් සෙල්ලම් කරනවා. ඒක දැකපු සිඟිති දුවලා ගිහින් පූස් පැටියාට හෙමින් පාරක් ගැසුවා. පූස් පැටියා දුවලා ගිහින් හැංගුනා. පූස් පැටියා බෝනික්කාගේ ඇගේ තිබුණු පුළුන් කැලි එලියට ඇදලා තිබුනා. පුංචි සිඟිතිට හරිම දුකයි.



අම්මා බෝනික්කාව ලස්සනට මහලා සිහිතිගේ අතට දුන්නා. ඒත් පුස් පැටියාට ගහපු එකට සිහිතිට හරිම දුකයි. සිහිති පුස් පැටියා ළඟට අරන් අතගාමින් සෙල්ලම් කලා.



වින්ඩිගේ ගවුම පුසා ඉරා තිබුණු නිසා සිඟිති එයාගේ ගවුමක් හොයන්න පටන් ගත්තා. සිඟිතිට එයා පුංචිකාලේ ඇඳපු ලස්සන ගවුමක් හම්බවුනා. සිඟිති ඒ පුංචි ගවුම වින්ඩිට ඇන්දුවා. දැන් වින්ඩි හරි ලස්සනයි සිඟිතිටත් හරිම සතුටුයි.



සිහිතිගේ උපන්දිනය ළඟ ළඟම එන නිසා සිහිතිට හොරෙන් අම්මා උපන්දින තෑග්ගක් අරන් ගෙදර ගෙනැවිත් තිබුනා. සිහිති බෝනික්කන්ට කැමති නිසා අම්මා තවත් ලස්සන බෝනික්කෙන් හා බෝනික්කන්ට අන්දවන පුංචි ලස්සන ඇඳුම් ද මහලා දුන්නා. සිහිති එයාගේ උපන්දින සාදයට යාළුවන්ට ආරාධනා කලා.



අම්මා දුන්නු තෑග්ග ආසාවෙන් පිළිගත් සිඟිති අලුත් බෝනික්කාට ‘මේරි’ කියලා නම දැම්මා. පසුදින සිඟිති පාසල් යාමට සූදානම් උනා. සිඟිති බෝනික්කන් දෙදෙනා ඇඳලගින් තියලා ගියා. පාසල් ඇරී පැමිණි සිඟිති මේරිව අරන් සෙල්ලම් කලා.



දැන් සිඟිත්ට වින්ඩිව මතකවත් නෑ, වැඩිපුර සෙල්ලම් කලේ මේරි සමග. ඉස්සරනම් සිඟිති යාළුවන් සමග සෙල්ලම් කලා. දැන්නම් සිඟිති මේරි සිටින නිසා යාළුවන් සමගවත් සෙල්ලම් කරන්න යන්නෙ නෑ.



එක දවසක් සිඟිති කෑම කනකොට පූස් පැටියා මේරි අරන් දුවනවා දැක්කා. සිඟිති කෑම එක විසිකරලා දුවගෙන ගොස් බලන විට මේරි කෑලි කෑලි වලට හපා තිබුණා. සිඟිතිට හරිම දුකයි.



සිඟිත්ට වින්ඩිව අමතක වෙලා තිබුනට අම්මාටනම් වින්ඩිව අමතක වෙලා තිබුණේ නෑ. අම්මා පරිස්සමෙන් අරන් තිබූ නිසා සිඟිත්ට ආපසු සෙල්ලම් කරන්න වින්ඩිව ලැබුණා.



මේරි හා වින්ඩි දෙදෙනාම එකලෙස බලාගත්ත නම් මේ වගේ දෙයක් වෙන්නෙනෑ කියලා සිඟිතිට හිතුනා. කවදාවත් මේ වගේ වරදක් කරන්නේ නෑ කියලා සිඟිති එයාගේ අම්මාට පොරොන්දු උනා.



<u>**පසුවදන**</u>



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදු වන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොතපතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම, ඔවුන්ගේ ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිද පරමාර්ථ ඇතිව 2014 වසරේදී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරනයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලගාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුලින් සම්පාදනයවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතරම, ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලසුම් කරුවන්ට මෙන්ම සමාජයේ වගකිව යුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.....

මෙයට<br>
සෙනෙවිරත්න මහලේකම්<br>
පාසල් දරුවන් ග්‍රන්ථකරනයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක<br>
2023.11.01

ISBN: 978-624-208-070-3